සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education – Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-........................................................................

විභාග අංකය :- ....................................

නිවැරදි බවට සහතික කරමි.

....................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් සමන්විතය.
- මෙම **පිටුවේත්, තුන්වැනි පිටුවේත්** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදිව ලියන්න.
- ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
- පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
- පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

  **A කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්.

  **B කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්.

- කටු වැඩ සඳහා හිස් කඩදාසි ලබාගත හැකිය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| A | 1 – 25 | |
| B | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| එකතුව | | |

| | |
|---|---|
| ..................... පළමු පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... දෙවන පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ගණිත පරීක්ෂක | ..................... සංකේත අංකය |
| ..................... ප්‍රධාන පරීක්ෂක | ..................... සංකේත අංකය |

## A කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**01.** මිනිසුන් 4 දෙනෙක් දින 5 කින් නිම කිරීමට තීරණය කර ඇති වැඩක් මෙන් දෙගුණයක වැඩක් මිනිසුන් 10 දෙනෙකුට දින කීයකින් අවසන් කළ හැකි ද?

**02.** සාධක සොයන්න. $x^2 - x - 6$

**03.** රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**04.** රූපයේ දක්වා ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ පරිමිතිය 39 cm ක් වේ.
එහි අරය 14 cm ක් නම් චාප දිග සොයන්න.



**05.** සුළු කරන්න. $\frac{1}{x} - \frac{3}{4x}$

To download past papers visit
www.vajirapani.blogspot.com

**06.** රූපයේ දී ඇති තොරතුරු අනුව BAD විශාලත්වය සොයන්න.



**07.** $\sqrt{42}$ හි අගය පළමු සන්නිකර්ෂණයට සෙවූ විට ලැබෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**(i)** 6.3 **(ii)** 6.4 **(iii)** 6.5 **(iv)** 6.6

**08.** රූපයේ දක්වා ඇති ඝනකාභ හැඩැති ටැංකියේ ධාරිතාව ලීටර් වලින් සොයන්න. ($1\ m^3 = 1\ 000l$)




**09.** රූපයේ තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**10.** විසඳන්න. $\frac{x}{2} - 1 = 5$

To download past papers visit
www.vajirapani.blogspot.com

**11.** ටැංකියේ ධාරිතාවය $\frac{7}{8}$ ක් පිරී ඇති ජල ටැංකියකින් $\frac{5}{7}$ ක් භාවිතයට ගත්තේ නම් භාවිතයට ගත් ජල ප්‍රමාණය ටැංකියෙන් කවර භාගයක් ද?

**12.** පහත ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

| | |
|---|---|
| ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ තුනෙහි එකතුව $180^\circ$ ක් වේ. | |
| පාද දෙකක් සමාන වන ත්‍රිකෝණයක සමාන පාදවලට සම්මුඛ කෝණ සෑම විටම සමාන වේ. | |
| සෘජුකෝණී ත්‍රිකෝණයක් අංග සම වන්නේ කර්ණ පා අවස්ථාව යටතේ පමණි. | |

**13.** 1 සිට 5 තෙක් අංක ලියූ සර්වසම කාඩ්පත් 5 ක් අතුරින් අහඹු ලෙස තෝරා ගන්නා ලද කාඩ්පතක් ඔත්තේ සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් වීමේ සම්භාවිතාව සොයන්න.

**14.** රූපයේ දී ඇති තොරතුරු අනුව AC දිග සොයන්න.




**15.** සාධාරණ පදය (Tn) = 3n + 2 වූ සංඛ්‍යා රටාවේ 10 වන පදය සොයන්න.

**16.** රූපයේ දැක්වෙන්නේ විෂ්කම්භය 14 cm ක් වූ අර්ධ වෘත්තයකි.
එහි වර්ගඵලය සොයන්න.




To download past papers visit
www.vajirapani.blogspot.com

**17.** ABC හා PQR ත්‍රිකෝණ පා.කෝ.පා. යටතේ අංගසමවීමට අවශ්‍ය ඉතිරි අංග යුගලය ලියන්න.




**18.** වෙන් රූපයේ දී ඇති තොරතුරු අනුව A′ කුලකය ලියා දක්වන්න.




**19.** පැයට කිලෝමීටර 60 ක ඒකාකාර වේගයෙන් ගමන් කරන රථයකට 180 km ක දුරක් යාමට ගතවන කාලය පැය කීයක් වේද?

**20.** (0 , 6) හා (1 , 4) ලක්ෂ්‍ය හරහා යන සරල රේඛාවේ අනුක්‍රමණය සොයන්න.

**21.** පහත දී ඇති වීජීය ප්‍රකාශනවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

$4a^2b$ , $6ab^2$

**22.** රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් BC පාදයේ දිග සොයන්න.




**23.** $x - 3 \geq 2$ අසමානතාවය තෘප්ත කරන කුඩාම ධන නිඛිලය ලියන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**24.** 2 , 4 , 6 , 8 , 9 , 11 , 15 , 17 , 20 , 21 , 25 යන සංඛ්‍යා ව්‍යාප්තියේ මධ්‍යස්ථය සොයන්න.

**25.** OA හා OB ට සම දුරින් AB මත පිහිටි X නම් ලක්ෂ්‍යයක් පථ පිළිබඳ දැනුම ඇසුරෙන් ලකුණු කරන්න.



## B කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**01.** රෙදි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන්නියක් විසින් රෙදි රෝලකින් $\frac{2}{5}$ ක් මේස රෙදි මැසීමට ද ඉතිරියෙන් $\frac{3}{4}$ ක් කොට්ට උර මැසීමට යොදා ගන්නා ලදී.

**(i)** මේස රෙදි මැසීමට යොදාගත් පසු ඉතිරි වූ ප්‍රමාණය මුළු රෙදි රෝලෙන් කවර භාගයක් ද?

**(ii)** කොට්ට උර මැසීමට යොදාගත් ප්‍රමාණය මුළු රෙදි රෝලෙන් කවර භාගයක් ද?

**(iii)** මේස රෙදි සහ කොට්ට උර මැසීමෙන් පසු ඉතිරි වූ රෙදි ප්‍රමාණය 9 m ක් නම් රෙදි රෝලේ තිබූ මුළු රෙදි ප්‍රමාණය මීටර කීයද?

**(iv)** මේස රෙද්දක් මැසීමට රෙදි 3 m ක් ද කොට්ට උරයක් මැසීමට රෙදි $\frac{1}{2}$ m ක් ද වැය වේ නම් මසන ලද මේස රෙදි ගණනත් කොට්ට උර ගණනත් වෙන වෙනම සොයන්න.

To download past papers visit
www.vajirapani.blogspot.com

**02.** මෙහි දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර කොටසකින් හා කේන්ද්‍රික ඛණ්ඩයකින් සමන්විත රූපයකි.




**(i)** BDC කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න.

**(ii)** ABDE කොටසේ වර්ගඵලය BCD කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය මෙන් දෙගුණයක් නම් AB දිග සොයන්න.

**(iii)** CD චාප දිග සොයන්න.

**(iv)** මුළු රූපයේ පරිමිතිය සොයන්න.

**(v)** කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලයට සමාන වර්ගඵලයකින් යුත් AEF සෘජුකෝණී ත්‍රිකෝණාකාර කොටසක් [illegible] BA මත AE ට [illegible] ලකුණු කළේ නම් AF හි දිග ගණනය කර [illegible] AEF [illegible] ඇඳ පෙන්වන්න.

**03.** කුකුළු ගොවිපලක කිකිළියන් 20 කට දින 30 ට ප්‍රමාණවත් වන සේ ආහාර ගබඩා කර ඇත.

**(i)** මෙම ආහාර ප්‍රමාණය එක් කිකිළියකට දින කීයකට සෑහේද?

**(ii)** දින 18 කට පසු තවත් කිකිළියන් 10 ක් මෙම ගොවිපළට ගෙන එන ලද නම්, සියළුම කිකිළියන් සඳහා මෙම ආහාර දින කීයකට ප්‍රමාණවත් වේද?

**(iii)** මෙම කිකිළියන් 10 දෙනා එකතු වුව ද ඉන් දින 4 කට පසු කිකිළියන් 6 දෙනෙක් මිය ගියේ නම් ඉතිරි ආහාර දින කීයකට ප්‍රමාණවත් වේද?

**(iv)** අවසානයේ දී ගොවිපළේ ගබඩා කර තිබූ ආහාර දින කීයකට ප්‍රමාණවත් වීද?

To download past papers visit
www.vajirapani.blogspot.com

**04.** ගොවි සංවිධානයකින් ලබාගත් තොරතුරු මත ගොවීන් 300 ක් වගා කරන බෝග පිළිබඳ තොරතුරු ඇසුරින් අඳින ලද වට ප්‍රස්තාරයක් මෙහි දැක් වේ.




**(i)** රබර් වගා කරන ගොවීන් ගණන කීය ද?

**(ii)** කුරුඳු වගා කරන ගොවීන් ගණන මෙන් හතර ගුණයක් පොල් වගා කරයි නම් පොල් වගා කරන ගොවීන් ගණන කීයද?

**(iii)** තේ වගා කරන ගොවීන් දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය කීයද?

**(iv)** රබර් වගා කරන ගොවීන්ගෙන් $\frac{1}{3}$ ක් රබර් ගලවා කුරුඳු වගා කිරීමට තීරණය කළේ නම් ඒ අනුව අඳින ලද වට ප්‍රස්තාරයක කුරුඳු වගා කරන ගොවීන් දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය කීයක් වේද?

**05.** ε = { 1 , 2 , 3 , 4 , 5 , 6 , 7 , 8 , 9 , 10 } ද

A = { 2 , 4 , 6 , 7 } ද

B = { 1 , 4 , 7 , 9 , 10 } ද නම්,

To download past papers visit
www.vajirapani.blogspot.com

**(i)** A∩B ලියා දක්වන්න.

**(ii)** A∪B ලියා දක්වන්න.

**(iii)** A′ ලියා දක්වන්න.

**(iv)** B′ ලියා දක්වන්න.

**(v)** ඉහත තොරතුරු වෙන් රූප සටහනක දක්වන්න.